**අරණායක ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අරණායක ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට **අරණායක** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළව රු.298,863 ක් වූ දිරි දීමනා ගෙවා තිබියදී ගෙවිය යුතු ලෙස නැවත දක්වා තිබුණි. | එය නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | 2021 වර්ෂයේදී වැඩිපුර අයකළ විශේෂ අත්තිකාරම් රු.12,000 ක් සමාලෝචිත වර්ෂයේදී ආපසු ගෙවීම, අයවිය යුතු ශේෂයක් ලෙස නැවත ගිණුම්ගත කර තිබුණි. | අත්වැරදීමකින් පරිගණක ගත වී ඇති අතර එය නිවැරදි කර ඇති බව. | - එම - |
| (ඇ) | ස්ථාවර වත්කම් ලේඛනය අනුව රු.40,083,712ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ 08ක වටිනාකම රු.6,183,967 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | එක් වාහනයක් මාවනැල්ල ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බවත් ඉතිරිය ගිණුම් ගතකර ඇති බව. | - එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු වියදම් සඳහා රු.32,021 ක් වැඩියෙන් සහ රු.6,000ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | තක්සේරු කිරීමට අසීරු නිසා ආසන්න අගයකට ණයහිමි ප්‍රතිපාදන වෙන් කළ බව. | - එම - |
| (ඉ) | රු.49,913,700 ක් වූ ගොඩනැගිල්ලක් සහ වටිනාකම තක්සේරු නොකරන ලද ඉඩම් 23ක් ගිණුම්ගත කර නොතිබුණි. | එම ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කරන බව. | - එම - |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි සහ ජංගම වත්කම් විෂයයන් 04ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය, ඒ ඒ ගිණුම් විෂයයන්හි උපයෝගී ලේඛන හා සැසඳීමේදී රු.807,219ක වෙනසක් පැවැතිණි. | එකඟ වේ. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂ උපයෝගී ලේඛන සමග එකඟ කළ හැකි විය යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.9,389,129ක් වූ ස්ථාවර වත්කම් ගිණුම් විෂයයන් 02ක් වෙනුවෙන් උපලේඛන ඉදිරිපත් නොවුණි. | අදහස් දක්වා නොතිබුණි. | ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 2011 සිට 2021 වර්ෂය දක්වා කාලයට අදාළ රු.628,194 ක් වූ වර්ෂ 02 ඉක්මවූ තැන්පතු 39ක් නිරවුල් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,733,416ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 10,879,874 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකු ගිණුමක පැවති රු.8,619,147ක ශේෂය කෙටි කාලීන ආයෝජනයක හෝ යොදවා ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර තැන්පතු සඳහා අනුමැතියට යොමු කළ ද එය මහ සභාවේදී සම්මත නොකරන ලද බව. | ආයෝජන මඟින් ආදායම් උපයා ගතයුතු වේ. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2022** | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන් තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,478,270 | 2,787,555 | 2,665,911 | 326,136 | 2,468,000 | 2,579,358 | 2,742,496 | 288,608 |
| කුලී | 4,632,500 | 3,376,427 | 3,375,962 | 147,441 | 2,602,200 | 3,422,025 | 3,022,628 | 456,755 |
| බලපත්‍ර ගාස්තු | 408,564 | 560,910 | 554,910 | 9,000 | 430,100 | 470,662 | 470,662 | - |
| වෙනත් ආදායම් | 3,101,200 | 4,483,650 | 3,707.597 | 61,904 | 2,639,000 | 3,495,917 | 3,819,322 | - |
| එකතුව | 10,620,534 | 11,208,542 | 10,304,380 | 544,481 | 8,139,300 | 9,967,962 | 10,055,108 | 745,363 |

**2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම්, අක්කර බදු හා කඩ කුලී යන ආදායම් විෂයයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.391,475ක් අයවිය යුතුව තිබුණි. එම වටිනාකම තුළ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරණි රු.164,504ක ශේෂයක් ද, වර්ෂ 05කට වඩා පැරණි රු.152,989ක ශේෂයක් ද පැවැතිණි. | හිගහිටි මුදල් ඉදිරියේදී අය කරන බව. | හිග ආදායම් නොපමාව අයකළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා දැන්වීම් පුවරු 35කින් රු.107,686ක් අයකර නොතිබුණි. එමෙන්ම, දැන්වීම් පුවරු ආදායම බිල් නොකිරීම නිසා වර්ෂය තුළ ලැබිය යුතු සම්පූර්ණ ආදායම ගිණුම්ගත වී නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 11/2010 දරන චක්‍රලේඛයේ 3.7 ඡේදය ප්‍රකාරව පළාත් පාලන ආයතන සතු බැකෝ යන්ත්‍ර නොමිලේ ලබාදීම නොකළ යුතු වුවද, ඊට අනුකූල නොවන ලෙස යන්ත්‍ර පැය 291ක් නොමිලේ ලබා දීම නිසා දළ වශයෙන් රු.1,309,500ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | මින් ඉදිරියට විෂය නිලධාරීන්ගේ ලිඛිත ඉල්ලීමක් මත පමණක් බැකෝ යන්ත්‍රය යෙදවීමට කටයුතු කරන බවත්, යම් පැය ප්‍රමාණයක් ක්‍රීඩාපිටි, මාර්ග හා පූජනීය ස්ථාන පිළිසකර කරන බවත්, ඉදිරියේදී ඉල්ලීම ලිඛිතව ලබා ගැනීමටත්, ක්‍රීඩා භූමි හා පන්සල් වැනි ස්ථාන සඳහා ප්‍රදේශවාසීන්ගේ මුදලක් ලබා ගැනීමටත් කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සභාවට එරෙහිව පනවා තිබුණු නඩු 06 ක් සම්බන්ධ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතු වේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 5කට වරක් සිදුකළ යුතු දේපළ තක්සේරු කිරීම 2011 වර්ෂයෙන් පසු සිදුකර නොතිබුණි. | තක්සේරු කටයුතු ආරම්භ කර ඇත. | නිවැරදිව ආදායම් උපයාගත යුතු වේ. |
| (ආ) | ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 2017 – 2022 වර්ෂ අතර කාලය තුළ අනුමත කළ අයදුම්පත්‍ර 253කින් අයදුම්පත්‍ර 24කට පමණක් අනුකූලතා සහතික නිකුත් කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ඉදිකළ ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රදේශවාසීන්ගේ විරෝධතා නිසා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ලබාගත් ඉඩමට කසළ බැහැර නොකර රු.880,000ක වාර්ෂික බදු පදනම මත ඉඩමක් ලබාගෙන කසළ බැහැර කර තිබුණි. 2022 වර්ෂය තුළ කසළ කළමනාකරණය වෙනුවෙන් රු.6,746,686ක් වැයකර තිබුණද, ඉන් පොහොර නිෂ්පාදනය කර ආදායමක් ඉපැයීමට සභාව අපොහොසත් වී තිබුණි. | කොම්පොස්ට් ව්‍යාපෘතියක් සඳහා ඇස්තමේන්තු හා ව්‍යාපෘති වාර්තාවක් සකස් කරන බව. | කසළ බැහැර කිරීම විධිමත් පරිදි සිදුකළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.5,235,846 ක් වූ විවිධ ණය හිමි ශේෂය තුළ වසර 1 ත් වසර 4 ත් අතර කාලයක් පැරණි රු.579,034 ක ශේෂ පැවැතුණි. | ගෙවීමට සහන ඉල්ලා ඇති අතර කර්මාන්ත ණයහිමි ගෙවීම් සඳහා පළාත් සභාවෙන් මුදල් ලද බව. | ණයහිමි ශේෂ නිරවුල් කළ යුතු වේ. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු නොවූ රු.518,000 ක් වූ ටේලර් 02 ක හිමිකාරීත්වය පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම, සභාව සතු රු.5,542,128ක් වූ වාහන 05ක අයිතිය නීත්‍යානුකූලව පවරා ගෙන නොතිබුණි. | වාහන පවරා ගැනීමට ලිපි යොමුකර ඇත. | වත්කම්වල හිමිකාරත්වය නිරවුල් විය යුතුය. |
| (ආ) | සභාව සතු සුසාන භූමි 03ක් සභා දේපළ ලෙස හඳුනා ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | - එම - |
| (ඇ) | වටිනාකම රු.3,505,000 ක් වූ සභාව සතු ට්‍රැක්ටර් 03ක් හා ටේලර් 2ක් වර්ෂ 2ත් වර්ෂ 10ත් අතර කාලයක සිට අක්‍රියව පවතී. | මෙම වාහන වෙන්දේසි කරන බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ 83 දෙනෙකු වූ අනුමත කාර්යය මණ්ඩලයෙන් පුරප්පාඩු 08ක් පැවතුණි. එමෙන්ම, ආදායම් එකතු කිරීම, රියැදුරු හා සෞඛ්‍ය පරිපාලක තනතුරුවල රාජකාරි සඳහා කම්කරුවන් යොදවා තිබුණි. | එකඟ වේ. | අවශ්‍යතාව පරිදි පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතු වේ. |